(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 176.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 ජූනි මස 23 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1067/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහව සිට වවුනියාව දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එවකට අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ බවත්;

(ii) ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රේල් පීලි සහ පාලම්, කොටස් වශයෙන් ආනයනය කර දෙපාර්තමේන්තුව විසින් හෝ දේශීය කර්මාන්තකරුවන් හරහා එකී දුම්රිය මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ඉන්දියානු කර්මාන්තකරුවන්ට දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම භාර දීමට තීරණයකර තිබේද;

(ii) එසේ නම්, එම තීරණයට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1087/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුධ, ගුවන් සහ නාවික යන ත්‍රිවිධ හමුදාවන්හි අශ්වාරෝහක අංශය තුළ සිටින අශ්වයන් සංඛ්‍යාව, එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අශ්වයන් නඩත්තු කිරීම සඳහා වැය කරන මුදල එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත අශ්වයන්ගෙන් ගනු ලබන ප්‍රයෝජන එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත හමුදාවන්ගේ අශ්වාරෝහක අංශයට තවත් අශ්වයන් ගෙන්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1121/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ ජෛව විවිධත්වයෙන් අනූන ජල පෝෂක ප්‍රදේශ රාශියක් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) එම ජල උල්පත් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කර ගැනීම සඳහා යම් වැඩසටහනක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1135/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ඉදිකළ කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයෙහි ඉදිකිරීම් අවසන් කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iii) එහි ගෘහස්ථ ක්‍රීඩාගාරය, ධාවන පථය හා පිහිණුම් තටාකය ඉදිකිරීමට වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එය විවෘත කිරීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(v) එහි නඩත්තු කටයුතු භාරව සිටින්නේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1182/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1291/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දනු ලබන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් කුඹුරු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මධ්‍යම රජයට අයත් වාරිමාර්ග නඩත්තුව හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

(ii) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයට අයත් වාරිමාර්ග නඩත්තුව හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1396/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 161 යෝජනාවට අනුව, වාණිජ වශයෙන් පුවක් වගාව උනන්දු කිරීම සඳහා එම වර්ෂය තුළදී අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) උක්ත යෝජනාව අනුව පිහිටවනු ලැබූ පුවක් එකතු කිරීමේ කලාප සංඛ්‍යාව කොපමණද;

(iii) එම කලාප පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iv) වර්ෂ 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවේ පුවක් නිෂ්පාදනය හා අපනයනය කළ පුවක් ප්‍රමාණය, මිල සහ මුළු වටිනාකම දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ශ්‍රී ලංකාවේ වාණිජ වශයෙන් පුවක් වගා කිරීම සඳහා නිශ්චිත සැලැස්මක් තිබේද;

(vi) එවැනි සැලැස්මක් සැකසීම පිළිබඳ වගකීම භාරගත යුතු අමාත්‍යාංශය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1484/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාත් සභාව යටතේ පාලනය වූ පාසල් අතරින් වසා දමා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පාසලේ නම හා පාසල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පළාත් පාසල් වසා දැමීමට හේතු කවරේද;

(iv) එම පාසල් සතුව පැවති ගොඩනැගිලි හා ඉඩම් මේ වනවිට ඵලදායී කටයුතුවලට යොදාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1600/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඇති බලාගාර තුනෙහි ආයු කාලය අවසන් වන වර්ෂය කවරේද;

(ii) එම බලාගාරයන්හි ආයු කාලය අවසන් වීමෙන් පසු එම බලාගාර තුනෙන් ලැබුණු බලශක්තිය ලබා ගැනීමේ විකල්ප ක්‍රමවේදය කවරේද;

(iii) එම බලාගාරයන්හි නිරන්තරයෙන් මතුවන තාක්ෂණික අර්බුද පිළිබඳව සලකා බැලීමේදී නියමිත කාලයට පෙර එම බලාගාර භාවිතයෙන් ඉවත් කිරීම මඟින් සිදු විය හැකි තත්ත්වය පිළිබඳව දිගුකාලීන ජනන සැලැසුම් සකස් කරනු ලබන සැලසුම් සම්පාදකයන්ගේ අවධානය යොමු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1183/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්ධමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1295/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ පදිංචිය සඳහා බෙදා දීමට හඳුනාගෙන ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ පදිංචිය සඳහා ඉඩම් නොමැති ජනතාවට ඉඩම් ලබා දීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින හෝ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1329/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල් ටී එල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (LTL Holdings (Pvt.) Ltd.) ආයතනයේ සේවකයන්ට කොටස් ලබාදීමේදී සිදුවී ඇති අක්‍රමිකතා හා එම ආයතනයේ දූෂණ වංචා පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත අංක ACC/FC/2015/403 යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) මේ වනතෙක් ඒ පිළිබඳව පරීක්ෂණ සිදු කර නොමැති බවත්;

(iii) එමනිසා එහි සේවකයන්ට මෙන්ම රටටද විශාල මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පැමිණිල්ල විභාග කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1677/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ බටහිර සහ කල්කුඩා අධ්‍යාපන කලාපවල තිබෙන පාසල්වල නම්, ගුරු වර්ගය අනුව එක් එක් පාසලේ සිටිය යුතු ගුරුවරු සංඛ්‍යාව සහ දැනට සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) මෙම දිළිඳු ග්‍රාමීය සිසුන්ට නිදහස් අධ්‍යාපනය සඳහා පවතින සමාන අයිතිවාසිකම් සහතික කිරීම පිණිස පවත්නා පුරප්පාඩු පිරවීමට යාබද අධ්‍යාපන කලාපවල අතිරික්ත ගුරුවරුන් මාරු කරන ලෙස නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයාට උපදෙස් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

14.

1397/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 162 යෝජනාවට අනුව, තේ, රබර් සහ පොල් පර්යේෂණ ක්‍ෂේත්‍රයන් වෙනුවෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදනය එකී පර්යේෂණ ආයතන තුන අතර බෙදාහරිනු ලැබුවේ කවර අනුපාතයට අනුවද;

(ii) තේ, රබර් සහ පොල් පර්යේෂණ ආයතනයන්හි සේවා නියුක්තකයන්ගේ සංඛ්‍යාව, එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2002, 2005, 2010 සහ 2014 වර්ෂවලදී, තේ පර්යේෂණ, රබර් පර්යේෂණ හා පොල් පර්යේෂණ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් ප්‍රතිපාදනය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉකුත් දශකය තුළ, තේ, රබර් සහ පොල් ක්‍ෂේත්‍ර තුනෙහි සිදුකළ පර්යේෂණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1468/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එක් පළාත් පාලන ආයතනයකට ලබා දුන් අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(v) වත්මන් යහපාලන රජය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.

අභාවප්‍රාප්ත ගරු ඒ. එම්. එස්. අධිකාරි මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.

අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රා රණතුංග මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.

අභාවප්‍රාප්ත ගරු මෛත්‍රීපාල හේරත් මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

4.

අභාවප්‍රාප්ත ගරු ආරියරත්න ජයතිලක මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය මඟින් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2016.11.24 දින සිට නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා පත් කර ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතාට පෞද්ගලික වන සේ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප හා රජයේ නිල නිවාසයක් ලබා දී නොමැති නම්, නිවාස කුලී දීමනාව ඇතුළු සියලු දීමනා (දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව හැර) ලබාදීමටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව 2016.11.24 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*4.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*11.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

15.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---